# මහවැලි එච් කලාපයේ වී ගොවීන් මුහුණ දෙන ගැටලු: ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එස්. පී. එම්. ආර්. එච්. සෙනවිරත්න***[1]
***පී.එම්. හේනෙගෙදර***[2]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ වී වගාව මූලික වශයෙන් වාරි පෝෂිත හා වර්ෂා පෝෂිත ප්‍රදේශවල සිදුකෙරෙන අතර වාරි ප්‍රදේශවලින් මහවැලි කලාපවලට සුවිශේෂී ස්ථානයක් හිමිව තිබේ. වී වගාව වැඩි වශයෙන් අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, මඩකලපුව, වව්නියාව, හම්බන්තොට සහ අම්පාර යන දිස්ත්‍රික්කවල ව්‍යාප්තව ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය වැඩි වශයෙන් මහවැලි කලාපවල සිදුවන අතර එය දළ ජාතික නිෂ්පාදනයෙන් 20% ක ප්‍රතිශතයක් ගනී. කෙසේ වුවද වී වගාව සම්බන්ධයෙන් කෘෂි උපකරණ, රසායනික ද්‍රව්‍ය වල මිල ඉහළ යාම සහ ශ්‍රමික හිඟය ආදි ගැටලු වලට වී ගොවීන්ට මුහුණ දීමට සිදුව තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් වී වගා කිරීමේ දි ගොවීන් මුහුණ දෙන ගැටලු කෙරෙහි අධ්‍යයනය කරනු ලැබයි. මෙම අධ්‍යයනය සඳහා දත්ත සහ තොරතුරු රැස්කිරීමෙ දී ප්‍රාථමික හා ද්විතීක දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද, ද්විතීක දත්ත රැස් කිරීම වාර්ෂික වාර්තා, පුවත්පත් ලිපි, අන්තර්ජාලය භාවිතා කරමින් සිදු කරන ලදි. මෙහි අධ්‍යයන ප්‍රදේශය ලෙස මහවැලි එච් කලාපයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉපලොගම ග්‍රාමයේ ගොවි පවුල් 30 ක් අහඹු ලෙස තෝරා ගැණිනි. ඒ අනුව මුළු නියැදි අධ්‍යනයේ දත්ත සහ තොරතුරු අධ්‍යයනය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත භාවිතා කර ඇත. සරල සංඛ්‍යාන විධික්‍රමය හරහා සංඛ්‍යා සටහන්, ප්‍රස්තාර, වගු භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදි. මේ අනුව බැලීමේ දී ඉපලෝගම ග්‍රාමයේ පවතින ගැටලු කිහිපයකි. එනම් ආදායමට වඩා වියදම ඉහළ යාම (17%), ලබා ගන්නා  අස්වැන්න නිශ්චිත මිලකට අලෙවි කර ගත නොහැකි වීම ආදියයි. මේ හේතුන් මත නියැදියේ ගොවීන් 18 දෙනෙකු එනම් 60% ක ප්‍රතිශතයක් වී වගාවෙන් ඉවත්ව වෙනත් අතිරේක වගාවන් කෙරෙහි නැඹුරු වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන අතර මහවැලි සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිපල ලබා ගැනීමට අපහසු වී ඇත.

ප්‍රමුඛ පදඃ කෘෂිකර්මය, වී වගාව, මහවැලි එච් කලාපය, ගොවි ගැටලු, ආදායම් ප්‍රතිලාභය,
ඉපලෝගම, ගොවි අයිතිවාසිකම්

*1 දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* senavirathnaharshani@gmail.com
*2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* mahinta2002@yahoo.com